ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

Press Notice No: HRC/P/i/S/19/09/24

**මාධ්‍ය ප්‍රකාශය**

**ජනාධිපතිවරණයේ මනාප ඡන්දය සම්බන්ධයෙන් දැනුම්වත් කිරීම.**

2024 සැප්තැම්බර් 21 වන දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණයේදී ඡන්ද දායකයින්ගේ දෙවන හෝ තෙවන මනාප ඡන්දය මැතිවරණ ප්‍රතිඵලයට අදාළ විය හැකි බැවින් ඊට අදාළ නීතිමය විධිවිධාන පිළිබඳ දැනුවත් භාවය ඉහළ නැංවීමට සහ මැතිවරණ ප්‍රතිඵලයට ප්‍රතිචාර වශයෙන් නොමග යවන තොරතුරු හෝ ප්‍රචණ්ඩත්වයට පෙළඹවීම් ඇති වන තත්ත්වයක් ඇතිවුවහොත් එම තත්ත්වය වැළැක්වීමට සුදුසු ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ජාතික මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත 2024 සැප්තැම්බර් මස 19 දින ලිපියක් මගින් දන්වා ඇත.

එහිදි පහත කරුණු පිළිබඳව අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය එම ලිපියේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

1. ඡන්ද දායකයින්ගේ දෙවන හා තෙවන මනාප ඡන්ද ගණන් කිරීම අවශ්‍ය වන අවස්ථාවක, අනුගමනය කළ යුතු මැතිවරණ ක්‍රියා පටිපාටිය පිළිබඳව හා අදාළ නීතිමය විධිවිධාන සම්බන්ධයෙන් අපේක්ෂකයින් හා දේශපාලන පක්ෂ දැනුම්වත්ව සිටින බව තහවුරු කර ගැනීම.

2. ඡන්ද හිමියන්ගේ දෙවන හා තෙවැනි මනාප ගණන් කිරිමට අවශ්‍ය වූ අවස්ථාවක අනුගමනය කළ යුතු මැතිවරණ ක්‍රියා පටිපාටිය හා නීතිමය ප්‍රතිපාදන පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම.

3. ඡන්ද දායකයකින්ගේ දෙවන හා තෙවන මනාප ඡන්ද ගණන් කිරීම අවශ්‍ය වන අවස්ථාවක, මැතිවරණ ප්‍රතිඵලය පිළිබඳව වැරදි තොරතුරු සන්නිවේදනය වීම වැළැක්වීම සඳහා ගතයුතු විශේෂ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය වේදිකා හා පණිවුඩ යෙදුම් මෙහෙය වන තාක්ෂණික සමාගම් සමග සම්බන්ධ වී අවශ්‍ය පියවර යොදා ගැනීම.

4. මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමේදි හෝ ඉන් පසුව විශේෂයෙන් සමාජ මාධ්‍ය වේදිකා සහ පණිවුඩ යෙදුම් හරහා ප්‍රචණ්ඩත්වයට පොලඹවන ඕනෑම ආකාරයක ප්‍රකාශයන් ප්‍රචාරයවීම වැළැක්වීම සඳහා නිතිය ක්‍රියාත්මක කරන අධිකාරින් සහ අදාළ නියාමන ආයතන සමග සම්බන්ධවී ක්‍රියාකාරි සැලැස්මක් සැකසීම. කෙසේ වෙතත් එවැනි සන්දහර්යක් තුළ පනවනු ලබන අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට අදාළව ඕනෑම සීමා කිරීමක් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල විය යුතු බවත්, එබැවින් එය අවශ්‍ය සාධාරණ හා සමානුපාතික විය යුතු බවත්ය.

නිහාල් චන්ද්‍රසිරි
මාධ්‍ය ප්‍රකාශක / අධ්‍යක්ෂ (පර් යේෂණ සහ අධීක්ෂණ අංශය)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2024/09/19

දුරකතනය: 011 2505595
විද්‍යුත් තැපැල: rm.director.hrcsl@gmail.com